# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**
නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 අගෝස්තු මාසයේ දී 54.4 ක දර්ශක අගයක් වාර්තා කරන ලද අතර, එය 2017 ජූලි මාසයට සාපේක්ෂව දර්ශක අගයයන් 0.1 ක සුළු වර්ධනයකි. මෙම ඉහළ යෑම සඳහා, ඉදිරියේදී සැපයීමට නියමිත නව ඇණවුම් සඳහා අවශ්‍ය තොග මිලදී ගැනීම් මෙන්ම, නිෂ්පාදන කටයුතු අඩු වේගයකින් වර්ධනය වීම නිසා තොග එක් රැස් වීම ද හේතුවෙන් ගැනුම් තොග උප දර්ශකය ඉහළ යාම ප්‍රධාන වශයෙන් දායක විය. ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප දර්ශකය, ආයතන වලට විශේෂිත වූ ගැටළු හේතුවෙන් ඉහළ යන ලදී. සේවය හැරයන ශ්‍රමිකයන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා නුපුහුණු ශ්‍රමිකයන් බඳවා ගැනීමේ අපහසුතාවය හේතුවෙන්, විශේෂයෙන්ම ඇඟලුම් කර්මාන්තය ආශ්‍රිතව, සේවා නියුක්ති උප දර්ශකය පහළ යන ලදී. කෙසේ වුවද, සේවා නියුක්ති උප දර්ශකය හැර සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලදී. තවද, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ධනාත්මක අගයක් වාර්තා කරයි.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 ජූලි මාසයේ දී වාර්තා වූ 59.1 ක දර්ශක අගයට සාපේක්ෂව අගෝස්තු මාසයේ දී 60.1 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. 2017 ජූලි මාසයට සාපේක්ෂව අගෝස්තු මාසයේ දී නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් මගින් සේවා අංශයෙහි අඛණ්ඩ වර්ධනය තවදුරටත් පවත්වාගෙන යන ලදී. 2017 ජූලි මාසයට සාපේක්ෂව 2017 අගෝස්තු මාසයේ දී සේවා නියුක්තිය අඩු වේගයකින් වර්ධනය වූ අතර නිම කිරීමට ඇති කාර්යයන් පහළ යන ලදී. තම සේවාදායකයන්ට ඉහළ කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා නව තාක්ෂණික ක්‍රමෝපායන් හඳුන්වා දීම/ව්‍යාප්ත කිරීම තුළින් මූල්‍ය සහ සන්නිවේදන අංශ නව ව්‍යාපාර සහ ව්‍යාපාර ක්‍රියාකාරකම් වර්ධනය සඳහා දායක විය. නවතැන් සහ ආහාරපාන සැපයීමේ අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම්වලද වර්ධනයක් දක්නට ලැබුණි. අය කරන මිල ගණන් උප දර්ශකය ඉහළ ගිය අතර, මෙහිදී සෘතුමය ඉල්ලුම හේතුවෙන් නවතැන් සහ ආහාරපාන සැපයීමේ අංශයෙහි සිදු වූ ඉහළ යෑම කැපී පෙනුණි. මේ අතර, 2017 අගෝස්තු මාසයේදී අපේක්ෂිත ශ්‍රම පිරිවැය උප දර්ශකය පහළ ගියේය.

| | ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජුනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | **2017** | 56.2 | 57.1 | 66.5 | 41.8 | 57.9 | 56.1 | 54.3 | 54.4 | - | - | - | - |
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | **2017** | 57.5 | 57.3 | 60.8 | 54.2 | 55.3 | 59.2 | 59.1 | 60.1 | - | - | - | - |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.